# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**මුදල් අමාත්‍යාංශය**
**සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**
**நிதி அமைச்சு**
**சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு**
**Ministry of Finance**
**State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development**


| මගේ අංකය / எனது இல / My No | DSD/HO/09/CBO/චක්‍රලේඛන | ඔබේ අංකය / உமது இல / Your No | ............ | දිනය / திகதி / Date | 2021.01.08 |
|---|---|---|---|---|---|

සියළුම,
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි බැංකු සමිති සහ බැංකු සභාපතිවරුන්,
ප්‍රාදේශීය සංවිධාන සහ ප්‍රජාමූල සංවිධාන සභාපතිවරුන්,

**සමෘද්ධි චක්‍රලේඛ :- 2018/06/ප්‍රජාමූල/07/2018/02** **එකතු කිරීම - 2021/02**

## <u>සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීම හා ලියාපදිංචිය අළුත් කිරීම - 2021</u>

උක්ත කරුණ සම්බන්ධව ප්‍රජාමූල සංවිධාන අංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක "ප්‍රජාමූල /02/2017/02" සහ "2018/06 ප්‍රජාමූල 07/2018/02" සහ "එකතු කිරීම 2019/01" යන චක්‍රලේඛ පදනම් කර ගනිමින් 2021 වර්ෂයට සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වල වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීම සහ ලියාපදිංචි අළුත්කිරීමට අදාල කටයුතු සිදු කල යුතු වේ.

02. ඉහත චක්‍රලේඛ උපදෙස් අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීම ( නිලවරණය) 2021 මාර්තු මස 31 දිනට පෙර පැවැත්විය යුතු අතර වාර්ෂික මහ සභා රැස්වීම පවත්වා දින 30 ක් ඇතුලත ලියාපදිංචිය අළුත් කිරීමට පියවර ගත යුතුවේ. සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන වාර්ෂික මහ සභා රැස්වීම් 2021.03.10 දිනට ප්‍රථම සහ සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වාර්ෂික මහ සභා රැස්වීම 2021 මාර්තු 31 දිනට ප්‍රථම පැවැත්වීමට කටයුතු කල යුතුවේ.

03. සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල ලියාපදිංචිය අළුත් කිරීමේ සංශෝධිත අයදුම්පත මේ සමග ඉදිරිපත් කර ඇති අතර සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන වාර්ෂික මහ සභා රැස්වීම් පවත්වා මාසයක් ඇතුලත අයදුම්පත පිටපත් 02 කින් සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතු ලිපි ලේඛණ සමග ප්‍රාදේශීය සමෘද්ධි කළමනාකරු වෙත භාර දීම සිදු කල යුතු අතර සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වල ලියාපදිංචිය අළුත් කිරීමේ සංශෝධිත අයදුම්පත පිටපත් 02 කින් සම්පූර්ණ කර වාර්ෂික මහ සභා රැස්වීම් පවත්වා මාසයක් ඇතුළත ඉදිරිපත් කල යුතු ලිපි ලේඛණ සමග සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන අධ්‍යක්ෂ වෙත භාර දීම සිදු කල යුතුය.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

04. සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු ලෙස රු. 300/- ක් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ තැන්පත් කර, ලියාපදිංචි අළුත්කිරීමේ අයඳුම්පත් ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු අතර ප්‍රමාද වී ඉදිරිපත් කරන අයඳුම්පත්‍ර සඳහා අමතර රු. 300/- ක ප්‍රමාද ගාස්තුවක් ගෙවිය යුතු වේ. මෙම ගෙවීම්වලට අදාල තහවුරු ලිපි සහ පෙර චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස් පරිදි අනිකුත් අවශ්‍ය ලිපිලේඛණ සමග අළුත්කිරීමේ අයඳුම්පතෙහි පිටපත් 02 සමග යොමු කිරීමට කටයුතු කල යුතු වේ.

05. Covid - 19 තත්වය මත නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම හා හුදකලා ප්‍රදේශ ලෙස නම් කිරීම මත වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීමට නොහැකි ප්‍රදේශවල සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවලට දැනට පත්ව ඇති නිල මණ්ඩලය 2021 වර්ෂය සඳහා මහ සභා ආවරණ අනුමැතියට යටත්ව විධායක සභාවේ අනුමැතිය මත නැවත පත් කර ගැනීමට කටයුතු කල හැකි වේ.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් -

1. ලේකම් - සමෘද්ධි,ගෘහ ආර්ථික, ක්ෂුද්‍රමූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. } කා.දැ.ස.
2. අධ්‍යක්ෂ - ක්ෂුද්‍රමූල්‍ය - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

} අ.ක.ස. (2, 3)